පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

"කාගෙද මේ ලස්සන ඉන්විටේෂන් කාර්ඩ් එක ? " පැන්සල පන්හිඳගේ මේසය උඩ තිබුණ ආරාධනා පත්‍රය අතට ගන්න ගමන් ඇහුවා.

"අද හවස අපේ ළමයෙකුගේ වැඩක් තියෙනවා. යමුද බලන්න? " පන් පැන්ගෙන් ඇහුවා.

"අපි අතර ඉන්න අය කරන කියන දේවල්වල හොඳ යමක්, අපේ හිතට දැනෙන යමක් තියෙනවානම් ඒ ගැන යමක් ලියන එක අපේ යුතුකමක්. ඒ අයව උනන්දු කරවන්න ඒ අයගේ ඉදිරි ගමනට අපිට පුලුවන් විදියට හයියක් වෙන්න පුළුවන්නම් මොන තරම් හොඳ දෙයක්ද ?"

දුවගේ උත්සවයට ඇවිත් අඩුපාඩුවක් ඇත්නම් කියන්න කියලයි හසිනිගේ මව් අපට ආරාධනා කළේ. අඩුපාඩු හදාගන්න උනන්දුවෙන එක බොහෝම හොඳ දෙයක්. " ඒත් ඉතින් ඒ දේවල් ඒ අයට මුණාටම කියනවා ඇරෙන්න පත්තර පිටු ළුවාසින් පුරවන්න නම් අපට උනන්දුවක් නෑ. හොඳ දෙයක් තියෙනවානම් ඒක අනිත් අයත් දැනගන්න එක වටිනවා."

"අපේ මිනිස්සුන්ගෙ නැත්තෙම ඕකනේ" පැන් පන්ගේ කතාවට හවුල් වුණා. මොනතරම් හොඳ දේ තිබුණත් තිබුණ එකම

සාමාරංගේත්‍රම්

"ඇයි පින් යන්නේ නැද්ද? දෙන්නෙකුට වඩා යන එක හරි මදි නේද ? " ඒ පැන්. පින්සලට එදා මොකක්දෝ රාජකාරියක්. අන්තිම මොහොතේ හරි යන්නයි පින් හිතාගෙන උන්නේ.

පන්ටත්,පින්ටත් එක එක විදියේ ආරාධනා ලැබුණත් පැන්ට ඒ වාගේ අවස්ථා ලැබෙනවා අඩුයි. ළඟදීනේ මෙහාට අවේ.

"කමක් නෑ යමු !" පන් පැන්ට කිව්වේ ඒ හින්දයි.

"අපි පත්තර වලට ලියන හින්දා එක එක විදියේ ආරාධනා ලැබෙනවා. ඒත් ඉතින් යමක් ලියන්න තියෙනවා නම් විතරයි ලියන්න වෙන්නේ. " පන් පැන් එක්ක හසිනි චිත්‍රමසේකර දුවගේ භරත නාට්‍ය අරංගේත්‍රම් උත්සවය බලන්න යන්න වාහනයට ගොඩවුණා.

"අපි යන්නේ බොහෝම අහිංසක ගමනක් ! " පන් රෝවිල් සෙකන්ඩරි විද්‍යාලයට වාහනය හැරෙව්වා.

ජීවිතේ කවදාවත් අරංගේත්‍රම් උත්සවයක් බලලා නැති පන් " පැන් දෙන්නා උත්සව ශාලාවට ඇතුල්වුනේ පොඩ්ඩක් වකිතයෙන්. පින්සල කල්තියාම ඇවිත් පන්හිඳයි පැන්සලයි ආසන වෙන් කරගෙන උන්නා. උත්සවය පටන් ගන්න පත්තු කරන පහන, පහනේ සැරසිල්ල, වේදිකා පසුබිම පවා වෙනමම සංස්කෘතියක කුකුණු පෙන්නුවා. වේදිකා පසුබිම විදියට තිබුණ කුළුණු දෙක මැද්දෙ ලොකුවට නිර්මාණය කරලා තිබුණ පාර්වතියගේ නර්තන රූපය උත්සවයේ ගෞරවාන්විත බව වැඩි කළා. පහන් දැල්වීමෙන් නමස්කාරවලින් පස්සේ උත්සවය පටන්ගත්තා. වේදිකාවේ පැත්තක සකස් කරලා තිබුණ වෙනම කුඩා පීඩිකාවන මෘදංගය කියන තාල වාද්‍ය භාණ්ඩය වාදනය කරන ශ්‍රී රවි රවීචන්ද්‍රිර, වයලිනය වාදනය කරන ශ්‍රී මුරලි කුමාර ශිල්පීන් දෙන්නා එක්ක ගායන ශිල්පි ශ්‍රී අභිලන් ශිවනන්දන් හා හසිනිගේ භාරත නාට්‍යමේ නර්තනාචාර්යවරිය වන ඌෂා ශ්‍රී පද්මනාදන් මහත්මිය අසුන්ගත්ත ශිල්පය හැදෑරූ සිසුවියන් දොරට වැඩිමේ සාම්ප්‍රදායික උත්සවයයි භාරත නාට්‍ය අරංගේත්‍රම් උත්සවය.

ඇත්තටම උත්සවය ඉවරවෙන කොට ඒ ගැන ලියා තියන්න වටිනා ගොඩක් දේවල් පන්, පින්, පැන් ගේ හිත්වල තුතුරු වෙලා තිබුණා. ඒ නැටුම් ශිල්පය ගැන අබ පියල්ලක තරම් දෙයක්වත් නොදන්නා පන් ගෙදර ඇවිත් සටහන් තිව්වේ මෙන්න මේ විදියටයි.

සැබැවින්ම භරත නාට්‍ය අරංගේත්‍රම් අප හට ඇළුත් අත්දැකීමක්. දකුණු ඉන්දීය කරණාටක සංගීත හා නර්තන සම්ප්‍රදායයන් මුළික කොටගෙන පැවැත්වෙන මෙම උත්සවය භරත නාට්‍ය නර්තනය හඳුල සිසුවියක සිය ශිල්ප ප්‍රගුණ කිරීමෙන් අතතුරුව කෙරෙන කල එළි මංගල්‍යයි. හෙළ නර්තන සම්ප්‍රදයේ එන වෙස් බැඳීම මෙන්ම මෙම උත්සවය ද වඩාත් ආගමික මුහුණුවරක් ගනියි. මව් බිමේ අප සහෝදර ද්‍රවිඩ ජනතාව වඩාත් මෙම ක්ෂේස්ත්‍රයට නැඹුරු වී සිටින අතර මේ සඳහා ඇළුම් කරනා සිංහල පවුල් පසුබිමක් සහිත දැරියන්ගේ සහභාගීත්වය ද එද මෙද තුර නොවෙනස්ව පවතියි. සැබැවින්ම ශිල්පයට පෙම් බැඳ ඒ වෙනුවෙන් ම කැප වූ දැරියකට විනා අන් අයෙකුට අරංගේත්‍රම් උත්සවයකින් කල එළි බැසීමට ඉතා අපහසු බවය අප හට හැඟ ගියේ.

ශිල්පය ලබා ගැනීමට සුදුසු නර්තනාචාර්යවරියක "ගුරු" වශයෙන් සළකා ඇය යටතේ ශිල්පය හැදෑරීමට නම් දැඩි විනය ගරුක බවත්, ඇය වෙත වන ගෞරවයත්, කැපවීමත්, පුහුණුවත් අත්‍යාවශ්‍ය වන බවයි අපගේ හැඟීම.

හසිනි චිත්‍රමසේකර දියණිය ඉෂාන්තිනී ශ්‍රී පද්මනාදන් අචාර්යවරිය යටතේ ශිල්ප හැදෑරීමට යොමු වන්නේ වසර දෙදහසේ පටන්. එවකට ඇයගේ වයස අවුරුදු පහක් පමණයි. මෙල්බර්න් නුවර උපන් ඇයගේ උද්‍යෝගය නිසාවෙන් ම ඇය ළගා වන ඉළක්කයන් බොහෝමය. දිනෙන් දින ශිල්පයෙන් මුහුකුරා යන ඇය සහභාගී වුණ විශේෂ අවස්ථා අතරට " නතයාලයා" ආයතනයේ වාර්ෂික ප්‍රසංග, මුම්බා උත්සවය, ඩෙරබින් ෆීස්ට් (ඊරදඉසබ ෆීඑ*, කෙල්ටන් ෆෙස්ටිවල් :කක්හඑදබ ෆිඑසඩ්ක*, ඕස්ට්‍රේලියානු දිනය :ඕඑරකස්බ ඊන්* "සලන්ගායි ඉන් සංගමම්", ටේස්ට් ඔෆ් ඉන්දියා :ඕඑද දම ඔබාස්* වැනි උත්සව නම් කිරීමට හැකියි. ඕස්ට්‍රේලියානු නර්තන නිළින ප්‍රධාන උත්සවයේ (ඕඑරකස්බ ඊබජ'ඇරි* "ක්‍රිෂ්ණා" ඇංශයේ නර්තන සාමාජිකාවක වශයෙන් "ආර්ට් සෙන්ටර්" (rt Centre) හිදී ද "වොන්කා ඒසියා පැසිෆික් (WONCA AISA PASIFIC) කලාප සමුළුවේදී ද ඇය දැක් වූ කුසලතා ඇයගේ නර්තන දිවියේ අගනා සමරු සටහන් වෙයි. ඇයගේ ශිල්පායතනයේ "රිදමිස් ඔෆ් ගේමිස්" බැසිල් ඇන්ඩ් ජෙස්මෙට්‍රි" (Basil and Geometry) වැනි නර්තනාංග සඳහා ද ඇයගේ දායකත්වය ලැබෙයි.

හසිනි සිය ප්‍රාථමික අධ්‍යාපනය එන්ඩේවර් හිල්ස් හි (Endeavour Hills) ජේමිස් කුක් (James Cook) ප්‍රාථමික විද්‍යාලයේ නිමා කළ අතර දැනට ලින්ඩේල් ද්විතීයික පාසැලේ :බහබාකර්ැජදබාර්හ කදකකැටැ* දහවන ශ්‍රේණියේ ඉගෙනීම ලබන්නීය. ප්‍රාථමිකයේ දී මෙන්ම ද්විතීකයේදී ද ඇය පාසැල් නායිකාව ?ජයදදක ඊවළිසබ* බවට පත් වුවාය.

කර්ණාටක සංගීතයට ගැයෙන ගායනාවන්ට අනුව ප්‍රසංගයේ ප්‍රථම භාගය හසිනි ශාස්ත්‍රීය නර්තනය වෙනුවෙන්ම වෙන් කළාය. අඩ තිරුවතින් යෙදෙනා කාම රංගනයන්ට අතුල් පහර දෙමින් සියලු නර්තනයන් සඳහා ඉන්ද්‍රිය ඇඳුමින් මනාව සැරසීගෙන පැය තුන " හතරක් තිස්සේ ඇය පෑ නර්තනයෙන් දෙනෙත් කිසි විටෙකවත් විඩාවට පත් නොවීම අරුමයකි. විවිධ ආකාරයෙන් අභිනයන් පාමින්ද, හස්ත මුද්‍රාවන් පාමින් ද මෘදංග එදයට අනුව පා තබමින්ද සිය සර්වාංගයම නර්තනයට යොමු කළාය ඇය සිය නම්‍යශීලි යොවුන් සිරුරේ මහිමය පාමින්. ඇයගේ සෑම ඉරියව්වක්ම සිතුවමට නැඟිය හැකි වූ කලාත්මක බවින් අනුන වුවක් විය.

විටෙක ගායනයේ අරුතට අනුව කාන්තා ලාලිත්‍යයෙන් කාන්තා චරිත මවනා ඇය තවත් විටෙක දැඩි පෞර්ෂයකින් යුත් පුරුෂ චරිත මවන්නීය. තවත් විටෙක නාගයෙකි ඇය. තවත් විටෙක පක්ෂියෙකි.

ප්‍රසංගයේ දෙවන භාගය ඇය යොමු වූයේ සිංහල ගීත කීපයකට භාරත නර්තනයෙන් ශිල්ප දැක්වීමටයි. පණ්ඩිත් අමරදේවයන්ගේ "අනෝතත්ත විල" ටී. එම්. ජයරත්නයන්ගේ "චන්ඩිකමට රණ්ඩුවක් වෙලා" එඩ්වඩ් ජයකොඩි ශිල්පියාණන්ගේ "මේ කොයි යන්නේ ?" වැනි ගීත කර්ණාටක සංගීත ක්‍රමවේදයන්ට අනුව ඉදිරිපත් වෙද්දී ඒවායේ අන්තර්ගතය රඟපා දැක්වුවාය ඈ. නුදෙකලාවම සිංහල ගීත කර්ණාටක සංගීතයට අනුව වැයීමද ද්‍රවිඩ ඌරුවට ගැයීමද නැවුම් අත්දැකීමක් විය අප හට. සාමාන්‍යයෙන් ගීයක් විනාඩි තුන හතරකින් නිමා වුවද නර්ටනය සඳහා ඒවා විනාඩි පහළොව " විස්ස දක්වා දීර්ඝව ප්‍රතිනිර්මාණය කර තිබිණ. ශාස්ත්‍රීය නර්ටන අංගයන් නම් එකක් විනාඩි හතළිහක් පමණ දිගුවන්නට ඇතැයි සිතන්නෙමු. එකී දීර්ඝ නර්ටන අංගයන් කිසිදු වෙහෙසක් නොදක්වා ඉදිරිපත් කළ හසිනි ප්‍රේක්ෂක අවධානය තමාගෙන් ඉවත නොයවන්නට හොඳින් වග බලා ගත්තීය. ඒ සඳහා ඇයගේ ශිල්පීය සංයමය ඉතා විශිෂ්ට තත්ත්වයක පැවතිණ.

සැබැවින් ම මෙම අරංගේත්‍රම් උළෙල සිංහල " ද්‍රවිඩ දෙපිරිස් එක් කළ සාම සංස්කෘතික මංගල්‍යක්ම විය. හසිනි දියණියගේ කුසලතා මෙන්ම අපගේ හදවත් හැඟීම් බර කළා වූ අනෙක් කාරණය වූයේ මේ දෙපිරිස අතරේ වූ අනොන්‍ය සහයෝගයයි.

"ලේ මොකද මේ ? " පැන් ඇහුවා.

"ඇයි මොකද ? " පින් එතෙන්ට දුවගෙන ආවා. "පන්ගේ කමිසය කාර්වල යතුරු එල්ලන කොක්කක එල්ලලා තියෙන්නේ ? " ඒ පැන්.

"ෂුවර් එකටම කාර් එකේ යතුර කමිස එල්ලන කොක්කක එල්ලලා ඇති ! " ඒ පින්.

" හෑබෑම නේන්නං .....! " ඒ පැන්.

"නැටුම් දැකලා ඔලුව කොලොප්පම් වෙලා ! "

අතිල් ගුණසේකර මෙහෙයවන
VINSARA අධ්‍යාපන ආයතනයේ
Specialist Maths
Maths Methods
Further Mathematics
Physics
English
Literature
Chemistry
Accounting
යන විෂයයන් සඳහා 2011 VCE විභාගය වෙනුවෙන් උපකාරක පන්ති
2010 නොවැම්බර් මාසයේදී ආරම්භවේ.
ඒ සඳහා සිසුන් බඳවා ගැනීම දැන් සිදුකෙරේ.
තවද
ඉහත විෂයයන් සඳහාම 11 වසර වෙනුවෙන්ද
6 වසරේ සිට 10 වසර දක්වා
Maths
English
Science
යන විෂයයන් සඳහාද සිසුන් බඳවා ගැනීම දැන් සිදුකෙරේ.
VINSARA Institute of Education
"Helping you to achieve your best"
4, Station Road
Rosanna , VIC 3084
Tel: 0433 11 3836, 9456 9552, Fax: 9456 9553
(ABN: 36 898 149 733)
www.vinsara.com.au